**ශීර්ෂය 25 - සීමා නිර්ණය කොමිෂන් සභාව**

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

-------------------------------------

සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුරූපීව පිළියෙල කර ඇති බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | දේපල ණය ලබාගත් නිලධාරියෙකු නොපැමිණීමත්, ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු මිනින්දෝරු දෙපර්තමේන්තුව විසින් සිදු කිරීමත් නිසා එම වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝජනයන් සිදු කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවීය. |
| (ආ) පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 08 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 70 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | කොමිෂන් සභාව වෙනුවෙන් ව්‍යවස්ථාදායක විසින් දැනට නිශ්චිත කාර්යභාරයක් වෙන්කර නොදීමත්, එම කාර්යයන් ඉටු කිරීමට පැවරුණහොත් ඉටු කිරීමට අවශ්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, එවැනි අවශ්‍යතාවයන් ඇති නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. එමෙන්ම කොමිෂන් සභාව ජාලගත කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සථිර ගොඩනැගිල්ලක් වෙත මාරුවීම කල් තැබීමට තීරණය විම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කරමින් පවතින අතර එය සකස් කළ වහාම ඉදිරිපත් කිරීම. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 264 | ආදායකයාගෙන් විධිමත් පරිදි මුද්දර යෙදූ කුවිතාන්සි ලබා නොගෙන රු.261,791 ක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | ඉදිරියේදී සෑම ගෙවීමක් සඳහාම අදාළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සි ලබාගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය හා 2017 අප්‍රේල් 19 දිනැති 03/2017 දරන චක්‍රලේඛ ලිපිය. | පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | 2019 වර්ෂයේ ලැබී ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගෙන ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කිරීම. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය, වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම් / ප්‍රතිඵල ආදිය එම සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. | 2019 සැලැස්ම සකස් කිරීමේදී අදාළ රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරනු ඇත. |

3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය හා 2002 සැප්තැම්බර් 22 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව 2019 මැයි 31 දින වන විටත් පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරමින් පවතින අතර එය සකස් කළ වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. |

3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික ආයතනයකින් ඇණවුම් කළ ලැප්ටොප් පරිගණකය සති 02 ක් තුළ | ප්‍රමාදවීම සඳහා ගාස්තු අයකරන පදනමින් ගිවිසුම්වලට එළඹිය යුතු වීම. | ගිවිසගත් කාලය තුළ අදාළ භාණ්ඩ සපයා දෙන ලෙස දැන්වුවද, භාණ්ඩ සැපයීමට |

| | | | |
|---|---|---|---|
| | සැපයීමට එකඟ වී තිබුණත්, මාසයකට වැඩි කාල පමාවකින් පසුව සැපයීම සිදු කර තිබුණි. | | මාසයකට වැඩි කාලයක් ගත වී තිබුණි. ඉදිරියේදී මෙවැනි ආයතන වෙත මිල ගණන් කැඳවීමට ලේඛන නිකුත් කිරීමේදී වඩාත් පරීක්ෂාකාරීව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | වායු සමීකරණ යන්ත්‍ර සැපයීමේදී මාස 06 කට වලංගු වන පරිදි කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කරන ලෙස සැපයුම්කරු වෙත දන්වා තිබුණත්, මාස 05 කට වලංගු වන පරිදි ඇප කරයක් ලබා දී තිබුණි. | සැපයුම්කරු සමඟ එළඹෙන ගිවිසුම්වල අදාළ කොන්දේසි කඩවීම් සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළත් කළ යුතු වීම. | කාර්යසාධන ඇපකරය තවත් මාසයකින් දීර්ඝ කර සපයන ලෙස 2019 පෙබරවාරි 15 දින අදාළ ආයතනය වෙත දන්වා ඇත. |